SINHALESE | සිංහල

WEBB STREET, NARRE WARREN

# ඔබේ නව NARRE WARREN දුම්රිය ස්ථාන පරිශ්‍රය

LEVEL CROSSING REMOVAL PROJECT




*Narre Warren දුම්රිය ස්ථානයේ ඊසානදිග දර්ශනය  චිත්‍ර ශිල්පියෙකුගේ සංකල්පනාවක් වන අතර වෙනස්කම් සිදු වීමට ඉඩ ඇත.*

## අන්තරාදායක හා තදබදයෙන් යුතු දුම්රිය හරස් මාර්ග 85ක් ඉවත් කිරීමට වික්ටෝරියානු රජය දක්වන කැපවීමේ අංගයක් ලෙස, අපි Webb Street, Narre Warren හි දුම්රිය හරස් මාර්ගය ඉවත් කරමින් සිටින්නෙමු.

Webb Street හි දුම්රිය හරස් මාර්ගය ඉවත් කිරීම, Pakenham දුම්රිය මාර්ගය වැඩි දියුණු කර 2025 වන විට දුම්රිය හරස් මාර්ග ඉවත් කිරීම සඳහා වන ඩොලර් බිලියන 15ක ආයෝජනයේ කොටසක් වේ.

Webb Street හි මාර්ගයට ඉහළින් උස් වූ දුම්රිය පාලමක් තැනීම මගින් අපි දුම්රිය හරස්මාර්ගය ඉවත් කරන්නෙමු.  අපි Narre Warren නව දුම්රිය ස්ථානයක් ද ගොඩනගන්නෙමු.  Narre Warren දුම්රිය ස්ථානය වැඩිදියුණු කරන ලද නවීන පහසුකම් හා ප්‍රජාවට විනෝද විය හැකි අවකාශවලින් සමන්විත වනු ඇත.

නව දුම්රිය පාලමක් ඉදි කිරීම මගින් දිනපතා දුම්රිය හරස්මාර්ගය ඔස්සේ ගමන් කරන වාහන 13,200ක තදබදය සමනය කරනු ඇත. එමන්ම රියදුරන්, පදිකයන්ට හා පාපැදිකරුවන්ට ගමනාගමනය වඩාත් ආරක්ෂිත හා වඩාත් පහසු කරවනු ඇත.

මෙම දුම්රිය හරස් මාර්ගය ඉවත් කිරීම මගින් දුම්රිය හරස් මාර්ගවලින් තොර Pakenham දුම්රිය මාර්ගයක් නිර්මාණය කරනු ඇත. එමගින් ආරක්ෂිත හා වඩාත් විශ්වාසදායක ගමනාගමන ජාලයක්, වඩා හොඳ සම්බන්ධතා සහ වැඩිදියුණු ගමන් කාලයන් ලබා දීමෙන් ප්‍රදේශවාසීන් ජීවත් වන, වැඩ කරන සහ ගමන් කරන ආකාරය වෙනස් කරනු ඇත.

ඉදිකිරීම් කටයුතු 2022 අගභාගයේ දී ආරම්භ වන අතර, 2025 වන විට දුම්රිය හරස් මාර්ගය ඉවත් කරනු ලැබේ.

Narre Warren නව දුම්රිය ස්ථානයේ වීඩියෝ සංචාරයක් සඳහාQR කේතය ස්කෑන් කරන්න.

# ඔබේ නව NARRE WARREN දුම්රිය ස්ථානය හඳුන්වා දීම




*චිත්‍ර ශිල්පියෙකුගේ සංකල්පනාවක් වන අතර වෙනස්කම් සිදු වීමට ඉඩ ඇත.*

- දුම්රිය ස්ථානයට පිවිසුම් මග
- භූමි දර්ශන සහිත අංගනයක්
- පරිශ්‍රය පුරා මංපෙත්
- පඩිපෙළවල්
- විදුලි සෝපාන
- මෝටර් රථවලට ප්‍රවේශය
- පාකිටියර් (බයිසිකල් නැවැත්වීමේ පහසුකම්)
- බයිසිකල් රඳවන
- PSO ආරක්ෂක සේවා නිලධාරීන්ගේ කාර්යාලය
- එකතුකර ගැනීමේ, බැස්සවීමේ සහ කුලී රථ කලාප
- සංඥා සහිත පදික මාරුවක්
- P වාහන නැවැත්වීමේ පහසුකම්
- ප්‍රවේශ විය හැකි වාහන නැවැත්වීමේ පහසුකම්
- බස් නැවතුම් ස්ථාන

# Narre Warren දුම්රිය ස්ථානයේ අංග

විදුලි සෝපාන හා පඩිපෙළ සහිත ඉහළට එසවුනු නවීන දුම්රිය වේදිකා දෙකක්.

අව්වැසිවලින් ආරක්ෂිත පඩිපෙළ, දුම්රිය වේදිකාවල ආවරණ සහිත ස්ථාන.

සම්පූර්ණයෙන් ම ආවරණ වූ වායුසමීකරණය කරන ලද රැඳී සිටීමේ කාමරයක්.

නව ප්‍රවේශපත්‍ර කාර්යාලයක් හා දුම්රිය ස්ථානයේ කුඩා කඩයක්.

පරිශ්‍රය පුරාවට ම මං පෙත්, ආරක්ෂිත කැමරා හා වැඩිදියුණු කළ ආලෝකකරණය.

දුම්රියපොළට දකුණු පසින් පුද්ගලයන් එකතුකර ගැනීමේ හා බැස්සවීමේ හා කුලී රථ කලාපයක්.

ප්‍රජාවට භුක්ති විඳිය හැකි ආසන සහ භූ දර්ශනය සහිත දුම්රියපොළ අංගනයක්.

බයිසිකල් 52 ක්, බයිසිකල් රඳවන 62ක් සඳහා Parkiteer (ආරක්ෂිත බයිසිකල් නවත්වන කුටියක්) හා දුම්රියපොළට හා Narre Warren වෙත බයිසිකල්වලින් ගමන් කරන මගීන් සඳහා බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක්.

දැනට පවතින වාහන නැවතුම් වැඩිදියුණු කිරීම.

Narre Warren දුම්රිය ස්ථානයේ දී ප්‍රජා සාමාජිකයන්ට ආරක්ෂිතව හා පහසුවෙන් පාර මාරුවිය හැකි බව තහවුරු කිරීමට Webb Street හි සංඥා සහිත පදික මාරුවක්.

Webb Street හි ගමනාගමනයට බාධා නොකර බස් රථ දෙකක් මාර්ගය දෙපස නැවැත්වීමට හැකි වන පරිදි වඩාත් දිගින් හා පළලින් යුත් බස් නැවතුම් ස්ථාන.



*චිත්‍ර ශිල්පියෙකුගේ සංකල්පනාවක් වන අතර වෙනස්කම් සිදු වීමට ඉඩ ඇත.*

## ව්‍යාපෘති කාලරාමුව

### 2021 - 2022 මුල්භාගය දක්වා
- පෙර විමර්ශන

### 2022 ජනවාරි
- සැලසුම් විසඳුම තහවුරු විය
- ක්ෂේත්‍ර විමර්ශන අඛණ්ඩව සිදු වේ

### 2022 මාර්තු
- සංකල්ප සැලසුම් නිකුත් කිරීම හා ප්‍රජා සහභාගීත්ව කටයුතු

### 2022 අගෝස්තු/ සැප්තැම්බර්
- අවසන් සැලසුම් නිකුත් කිරීම
- කලින් සිදු කරන කටයුතු ආරම්භ කිරීම

### 2022 අගභාගය
- ප්‍රධානතම ඉදිකිරීම් ආරම්භ වේ

### 2025
- දුම්රිය හරස්මාර්ගය ඉවත් කෙරේ.


** කාලරාමුවේ වෙනස්කම් සිදුවිය හැකිය.*

## Narre Warren–Cranbourne Road ඉහළින් දිවෙයි

Webb Street මාර්ගයට ඉහළින් දිවෙන දුම්රිය පාලමට අමතරව, Narre Warren-Cranbourne Road මාර්ගයේ දැනට පවතින පාලමට ආසන්නයෙන් ඉහළින් දිවෙන නව වානේ පාලමක් ද අපි ඉදි කරන්නෙමු.

Webb Street මාර්ගයට ඉහළින් ඇති දුම්රිය පාලම මගින් මෙම නව පාලම, දුම්රිය ස්ථානයේ නැගෙනහිර දිශාවට සම්බන්ධ කරනු ඇත.

දුම්රිය මාර්ගයට වැදගත් නඩත්තු ප්‍රවේශය සැපයීම සඳහා දැනට පවතින පාලම එසේම පවතිනු ඇත.



*චිත්‍ර ශිල්පියෙකුගේ සංකල්පනාවක් වන අතර වෙනස්කම් සිදු වීමට ඉඩ ඇත.*

## අප අමතන්න


contact@levelcrossings.vic.gov.au

1800 105 105

Level Crossing Removal Project
GPO Box 2392, Melbourne VIC 3001


සමාජ මාධ්‍ය ඔස්සේ අපව අනුගමනය කරන්න
@levelcrossings

Interpreter

පරිවර්තන සේවය – ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවන් සඳහා කරුණාකර 9209 0147 අමතන්න.

ප්‍රවේශ විය හැකි ආකෘතියකින් මෙම තොරතුරු ලබා ගැනීමට ඔබ කැමති නම්, කරුණාකර අප අමතන්න.

ශ්‍රවණ හෝ කථන ආබාධ නිසා ඔබට උපකාර අවශ්‍ය නම්, කරුණාකරrelayservice.gov.au වෙත පිවිසෙන්න.


WPA8231